# වෛදික පත පොතින් හෙළිවන බ්‍රාහ්මණ පාන්තිකයන්ගේ බලකාමීත්වය

ආනන්ද විජේරත්න

The divine origination of the caste system is unanimously accepted not only by the Hindu religious teachings, but also by the sacred Indian texts such as the **Rig Veda.** They have also endeavoured to establish and justify the caste duties that are founded on the caste system. The Indian caste system, which is supposed to be artificially imposed on society, exposes its own distinction from the other caste systems originating and evolving in a natural basis within society that based on different trades. A meticulous study shows that the Indian caste system is closer to a class system than a caste system that exists in other societies. The main idea of this article is to point out such differences.

වර්ගයා අතර සිය බලය පවත්වා ගෙන යෑම සඳහා වන අභිලාෂය මිනිසුන් අතර පමණක් නොව තිරිසන් සතුන් අතර ද පොදුවේ දක්නට ලැබෙන සහජ ගති ලක්ෂණයකි. තමන් වාසය කරන අඩවියෙහි සිය බලය තහවුරු කර ගන්නා ඇතැම් තිරිසන් සත්තු සිය වර්ගයාගේ ආගන්තුකයකු පවා තම බල ප්‍රදේශයට පැමිණීම නො ඉවසති. මිනිසා තුළ ද පවත්නා වූ බලය ලබා ගැනීමෙහි හා තහවුරු කර ගැනීමේ සහජ ආශාව තිරිසන් සතුන්ගෙන් වෙනස් වනුයේ ඒ සඳහා මිනිසා විසින් උපයෝගී කර ගනු ලබන්නා වූ ක්‍රියා මාර්ගයන්ගේ සුවිශේෂත්වය පදනම් කොට ගෙනය.

ඈත අතීතයේ සිට ම මිනිසා සිය බලය තහවුරු කර ගැනීම සඳහා පෞද්ගලිකව ද කුල, ගෝත්‍ර, ජාති, පන්ති සහ ආගමික සංවිධානයන් මගින් ද ගන්නා ලද උත්සාහයන් හා ඒවායේ ඵල විපාක ද ඉතිහාසයෙහි ඇතුළත්ව ඇත. අන් අයට වඩා ඉහළින් සිටීමට පුද්ගලයකු තුළ පවත්නා ආශාව ජාතියක් අනෙක් සියලු ජාතීන් අභිභවා ඉහළින් සිටීමේ ආශාව දක්වා පැතිර යා හැකිය. වෛදික යුගයේ ආර්ය සමාජය දෙස බලන විට පැහැදිලි වශයෙන් දක්නට ලැබෙන්නේ ආර්යයන් ද කිසියම් ආකාරයක බලය තහවුරු කරගැනීමේ උත්සාහයක නියැලී සිටි බවය. එහි දී ආර්ය සමාජය සමස්තයක් වශයෙන් අනෙකුත් භාරතීය ස්වදේශික සංවිධාන හා සමග ද විශේෂයෙන් බ්‍රාහ්මණයන් ආර්ය සමාජය තුළ ද කටයුතු කළ ආකාරය සැකෙවින් විමසා බැලීම සහ ආර්ය සමාජ සංවිධානයෙහි ද බ්‍රාහ්මණයන් කුල ක්‍රමයට (Caste System) ආවේණික වූ ක්‍රියා